පොල්ලෙ බලේ

වි. සුතේයෙව්

වි. සුතේයෙව්

අනුවාදය

පද්ම හර්ෂ කුරණාගේ

පොල්ලෙ බලේ

Kanol

ඉත්තෑවා ගෙදර යමින් හිටියා. ඔහොම යනකොට ඌට හාවෙක් හම්බ වුණා. දෙන්න එක්කම යනවා. කතාව ගමනට ඉනිමගක් නොවැ.

ගෙදරට හුඟාක් දුරයි. උන් කතා කර කර යනවා.

පාරේ පොල්ලක් තිබුණා.

කතා කර කර යන ගමන් හාවා පොල්ල දැක්කෙ නෑ. ඌ පොල්ලෙ හැපිල නොවැටුණේ යන්තමින්.

"ඕ, උඹ!.." හාවා තරහයෙන් කීවා. ඌ පොල්ලට පයින් ගහපුවාම පොල්ල හුඟක් ඈතට විසි වුණා.

නමුත් ඉත්තෑවා පොල්ල අරගෙන කරේ තබාගෙන දුවල ගියා, හාවා හම්බුවෙන්න.

ඉත්තෑවා පොල්ල ගේනවා දැකලා හාවා පුදුම වුණා.

"මක්කටද උඹට පොල්ලක්, මොකක්ද ඒකෙන් ඇති වැඩේ ?"

"මේ පොල්ල සාමාන්‍ය එකක් නෙවෙයි. මේක බලය තියන පොල්ලක්" ඉත්තෑවා කීවා.

හාවා 'පුහ්' ගෑවා විතරයි.

උන් ඔහොම ගිහිල්ල දියපාරක් ළඟට ආවා.

හාවා එක පිම්මෙන් දියපාර හරහා පැනල එහා ඉවුරෙ ඉඳල කෑ ගහනවා:

"ඕයි, කූරු රාළ, ඔය පොල්ල විසි කරපන් ඔය පොල්ලත් එක්ක උඹට පනින්න බෑ !"



ඉත්තෑවා මුකුත් කිව්වෙ නෑ. උඹ ටික දුරක් පස්සෙන් පස්සට ගිහිල්ලා දුවගෙන දුවගෙන ගිහින් පොල්ල දිය පාර මැද්දෙ ගහල පැන්නා එක පිම්මෙන්ම එහා ඉවුරට. දැන් උඹ හාවා ළඟින් ඉන්නවා, අමුත්තක් නැතුව වගේ.

හාවා පුදුමයෙන් කටත් ඇරියා:

"උඹට අගේට පනින්න පුළුවන් නොවැ!"

"මම පනින්න කොහොමත් දන්නෙ නෑ" ඉත්තෑවා කීවා. "මම පනින කොට මේ පොල්ලෙ බලේ මට පිහිට වුණා."

උන් තවත් දුර ගියා. ඔහොම ටික දුරක් යනකොට මඩ ගොහොරු බිමකට ආවා. හාවා හෙමින් හෙමින් පැන පැන යනවා. ඉත්තෑවා පස්සෙන් යන ගමන් පොල්ලෙන් පාර සෝදිසි කරනවා.

"ඕයි කුරු රාළ, මොකද උඹ ගාට ගාටා එන්නෙ? බාගදා උඹේ පොල්ල..."

හාවාට මෙය කියල ඉවර කරන්නත් ලැබුණෙ නෑ, උං මඩ ගොහොරුවක වැටිල කණ දක්වාම එරුණා. වතුර පෙවෙනවා, ගිලෙන්න යනවා.

ඉත්තෑවා හාවා ළඟට කිට්ටුවෙලා කෑ ගහනවා:

"මේ පොල්ල අල්ල ගනින්! හයියෙන්!"

හාවා පොල්ල අල්ල ගත්තා. ඉත්තෑවා ඇගේ ඇති වීරියෙන් ඇදලා යාළුවව මඩ ගොහොරුවෙන් එළියට ගත්තා.

වේලුණු තැනකට ආවාම හාවා ඉත්තෑවාට කියනවා:

"ඉත්තෑ හාමි උඹට ස්තුතියි, උඹ මාව බේරාගත්තා."

"උඹ මේ මොනව කියනව ද! ඒක පොල්ලෙ බලේ, අමාරුවකදි පිහිට වෙනවා."

උන් තවත් දුර ගියා. ඔහොම යනකොට අඳුරු කැලේ එළිමහන් බිමේ කුරුළු පැටියෙක් වැටිල ඉන්නවා දැක්කා. කුරුළු පැටියා කුරුළු කූඩුවෙන් වැටිලා. ඌ දුකින් කෑ ගහනවා. කුරුළු මව්පියෝ ඌට ඉහළින් ඉගිල්ලෙනවා. මොනව කරන්නද කියල දන්නෙ නෑ.

"පිහිට වෙයල්ලා, පිහිට වෙයල්ලා!" උන් කෑ ගහනවා.

කුරුළු කූඩුව තියෙන්නෙ උඩ. කොහොමටවත් කිට්ටුවෙන්න බෑ. හාවාත්, ඉත්තෑවාත් ගස් බඩ ගාන්න දන්නෙ නෑ. නමුත් පිහිට වෙන්න ඕනෑ.

ඉත්තෑවා හිතල, හිතල තීරණයකට ආවා. "ගහට හේත්තු වෙලා හිට ගනින්!" ඉත්තෑවා හාවාට අණ කළා.

හාවා ගහට හේත්තු වෙලා හිටගත්තා. ඉත්තෑවා කුරුළු පැටියව පොල්ලෙ කෙරවල ඉන්දවල, හාවගෙ කර උඩ නැගල පොල්ල දික් කළා කුරුළු කූඩුව ළඟටම.

කුරුළු පැටියා තවත් වරක කෑ ගහල එකපාරටම කුරුළු කූඩුවට පැන්නා.

කුරුළු අම්මයි, තාත්තයි හරි සන්තෝසයි. හාවයි ඉත්තෑවයි වටේ ඉගිලි ඉගිලි කෑ ගහනවා:

"ස්තුතියි, ස්තුතියි, ස්තුතියි!"

හාවා ඉත්තෑවට කියනවා:

"ඉත්තෑ හාමි උඹ හරි හපනෙක්! උඹ අගේට හිතුවා!"

"උඹ මේ මොනව කියනවද! ඒක මේ පොල්ලෙ බලේ, ඉහළ නගින්නත් පුළුවන්!"

උන් කැලේට ආවා. දුර යන්න යන්න කැලේ ගනයි, අන්දකාරයි. හාවා බයයි. නමුත් ඉත්තෑවට ගානක්වත් නෑ. ඉස්සරහින් යනවා. පොල්ලෙන් අතු එහාට මෙහාට කරනවා.

ඔන්න එක පාරටම ගහක් පිටුපසින් මහා වෘකයෙක් පැනල පාර අවහිර කරල ගොරවනවා:

“හිටපියව්!”

හාවා ඉත්තෑවත් එක්ක නතර වුණා.

වෘකය තොල කට ලෙවකාලා දත්මිටි කාලා කියනවා: “ඉත්තෑවෝ, මම උඹට අත තියන්නෙ නෑ. උඹේ කූරු තියෙනවා. නමුත් වපරයා, උඹව මම එහෙම පිටින්ම, කණයි වල්ගෙයි ඔක්කොම එක්ක කනවා!”





හාවා බයෙන් වෙව්ලුවා. සීත කාලෙදි වගේ සුදුමැලි වුණා. දුවන්න බෑ. කකුල් පොළොවට ඇලිලා. හාවා ඇස් පියා ගත්තා. දැන් වෘකයා කනවා.

ඉත්තෑවා විතරක් බය වුණේ නෑ. ඉත්තාවා පොල්ල වනලා ඇගේ ඇති වීරියෙන් වෘකයගෙ කොන්දට පාරක් දුන්නා. වෘකයා කෑගහල උඩපැනලා දුවන්න පටන් ගත්තා...

ඉතින් වෘකයා එකපාරක්වත් පස්ස නොබලා දිව්වා.

"ඉත්තෑවො උඹට ස්තුතියි, උඹ මේ පාර මාව වෘකයගෙන් බේරා ගත්තා!"

"ඒක මේ පොල්ලෙ බලේ, හතුරට බැටේ දෙනවා" ඉත්තෑවා කීවා.

දෙන්නා ඔහොම තවත් දුර ගියා. කැලෙන් ගිහිල්ලා පාරකට වැටුණා. පාර බොහොම අමාරුයි. කඳු පාරක්.

ඉත්තෑවා පොල්ල උපකාර කරගෙන ඉස්සරහින් යනවා. අසරණ හාවා පහුවෙලා, මහන්සියෙන් නොවැටෙන එක විතරයි.

ගෙදරට හුඟක් කිට්ටුයි. හාවාට තවත් දුර යන්න බෑ. "කමක් නෑ, මේ පොල්ල අල්ල ගනින්" ඉත්තෑවා කීවා.

හාවා පොල්ල අල්ලගත්තා. ඉත්තෑවා ඔහුව කඳු මුදුනට අරන් යනව.

ගමන පහසු වගේ හාවාට දැනුණා.

"බලපන්කො උඹේ පොල්ල මට ආයෙත් සැරයක් පිහිට වුණානේ." හාවා ඉත්තෑවට කියනවා.

ඉතින් ඔහොමයි ඉත්තෑවා හාවාව ගෙදර අරගෙන ගියේ. හා බිරිඳයි, හා දරුවොයි හුඟාක් වෙලා ඉඳල මග බල බල ඉන්නවා.

ඔක්කොටම සන්තෝසයි. හාවා ඉත්තෑවාට කියනවා:

"උඹේ ඔය පුදුම පොල්ලෙ බලේ නැත්නං මට ගෙදර එන්න හම්බු වෙන්නෙ නෑ."

එතකොට ඉත්තෑවා හිනා වෙලා කියනවා:

"මේ පොල්ල මගෙන් තෑග්ගක් හැටියට ගනින්. බාගවෙලාවට උඹට ආයෙත් පිහිට වෙන්න පුළුවන්."

හාවා පුදුම වුණා.

"උඹ කොහොමද මේ පුදුම පොල්ලෙ බලේ නැතුව ඉන්නෙ?"

"කමක් නෑ, පොල්ලක් ඕන වෙලාවක හොයා ගන්න ඇහැකි. නමුත් බලේ" ඉත්තෑවා තම ඔළුවට තට්ටු කරල කියනවා "බලේ මෙන්න මෙතනයි!"

හාවාට ඔක්කොම යසට තේරුණා.

"උඹ කිව්ව එක හරි. පොල්ල නෙවෙයි වැදගත්. නුවණ ඇති ඔළුවත්, කරුණාවන්ත හදවතත්!"



පොල්ලෙ බලේ

කතාව සහ චිත්‍ර

වි. සුතේයෙව්

අනුවාදය

පද්ම හර්ෂ කුරණගේ

නව සකැසුම

මාලක ලලනජීව

ISBN 978-955-1979-05-8

ප්‍රකාශනය

කැනොල් පබ්ලිෂිං හවුස්

2009

Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 011 4336779

ISBN 978-955-1979-05-8
Rs. 80/-
9 789551 979058